**ශීර්ෂය 150 - ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 24 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 16 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට ( ශ්‍රී. ලං. වි. ප්‍ර ) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මග හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වු ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය විසින් ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වන බව ප්‍රකාශ කළ නොහැකි විය.

(ආ) අමාත්‍යාංශය විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින්, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 3.1 ඡේදය ප්‍රකාරව භාණ්ඩාගාර අවසන් ගිණුම් ප්‍රකාශවල සඳහන් සංඛ්‍යා පදනම් කර ගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුව තිබුණි. 2018 වර්ෂයේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ පහත සඳහන් ලැබීම් හා ගෙවීම් එම විධිවිධාන අනුව ගිණුම්ගත කර නොතිබුණි.<br><br>(i) භාණ්ඩාගාර අවසන් ගිණුම් ප්‍රකාශය අනුව අත්තිකාරම් ලැබීම් රු.7,540,852 ක් වී තිබුණත් එය රු.4,563,299 ක් අඩුවෙන් රු.2,977,553 ක් ලෙස දක්වා තිබුණි.<br><br>(ii) භාණ්ඩාගාර අවසාන ගිණුම් ප්‍රකාශය අනුව තැන්පත් ලැබීම් රු.1,563,993 ක් වී තිබුණත්, එය රු.175 ක් අඩුවෙන් රු.1,563,818 ක් ලෙස දක්වා තිබුණි.<br><br>(iii) ඉහත සඳහන් නිරීක්ෂණ අනුව එම ප්‍රකාශවල ආදායම් හා ආදායම් නොවන ලැබීම් රු.309,777,317 ක් වී තිබුණත් එය රු.4,623,474 ක් අඩුවෙන් රු.305,153,843 ක් ලෙස දක්වා තිබුණි.<br><br>(iv) භාණ්ඩාගාර අවසාන ගිණුම් ප්‍රකාශය අනුව පුනරාවර්තන වියදම රු. 217,103,227 ක් වී තිබුණත් එය මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ රු.168,033 ක් අඩුවෙන් රු.216,935,194 ක් ලෙස දක්වා තිබුණි. | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. | 2018 වර්ෂයේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය සකස් කිරීමට ලබාදී ඇති ආකෘතියේ අත් මුදල් ගැලපුම් ගිණුමක් ඇතුළත් කිරීම හා එහි ශේෂය ගැලපීමට ස්ථානයක් නොමැතිවීම නිසා අදාළ ගැලපීම් ප්‍රකාශනය තුළම සිදු කර ඇත. නමුත් ඉදිරියේ දී ගැලපුම් ගිණුමක් සකස් කර ඒ අනුව අවසාන ගිණුම් සකස් කිරීමට පියවර ගනිමි. |

(v) භාණ්ඩාගාර අවසාන ගිණුම් ප්‍රකාශනය අනුව මූලධන වියදම රු.59,856,632 ක් වී තිබුණත්, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ එය රු.4,000,001 ක් අඩුවෙන් රු.55,856,631 ක් ලෙස දක්වා තිබුණි.

(vi) භාණ්ඩාගාර අවසන් ගිණුම් ප්‍රකාශය අනුව තැන්පත් ගෙවීම් රු.1,564,017 ක් වී තිබුණත්, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ එය රු.175 ක් අඩුවෙන් රු.1,563,842 ක් ලෙස දක්වා තිබුණි.

(vii) භාණ්ඩාගාර අවසාන ගිණුම් ප්‍රකාශය අනුව අත්තිකාරම් ගෙවීම් රු.5,949,577 ක් වී තිබුණත්, එය මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ රු.771,518 ක් අඩුවෙන් රු.5,178,059 ක් ලෙස දක්වා තිබුණි.

(viii) ඉහත සඳහන් නිරීක්ෂණ අනුව මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ වියදම රු.284,473,453 ක් වී තිබුණත් එය රු.4,939,727 ක් අඩුවෙන් රු.279,533,726 ක් ලෙස දක්වා තිබුණි.

(ix) ඉහත සඳහන් නිරීක්ෂණ අනුව 2018 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගිණුමේ ශේෂය රු.25,303,864 ක් වී තිබුණත්, එය මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ රු.316,253 ක් වැඩියෙන් රු.25,620,117 ක් ලෙස දක්වා තිබුණි.

(x) මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය අනුව අග්‍රිම ගිණුමේ ශේෂය හා භාණ්ඩාගාර අවසාන ගිණුම් ප්‍රකාශනය අනුව අග්‍රිම ගිණුමේ ශේෂය අතර වෙනසක් අනාවරණය වී තිබුණත්, රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 7 (vi) ඡේදය ප්‍රකාරව

අක් මුදල් ගැලපීමේ ගිණුමක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**1.6.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 3.1 ඡේදය ප්‍රකාරව භාණ්ඩාගාර අවසාන ගිණුම් ප්‍රකාශවල සඳහන් වත්කම් ශේෂ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ සඳහන් කළ යුතුව තිබුණි. භාණ්ඩාගාර අවසන් ගිණුම් ප්‍රකාශය අනුව අමාත්‍යාංශයේ වත්කම්වල වටිනාකම රු.157,383,793 ක් වී තිබුණත්, එය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ රු.97,261,955 ක් වැඩියෙන් රු.254,645,748 ක් ලෙස දක්වා තිබුණි. | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුවීම. | අමාත්‍යාංශයේ සියළුම දේපල, පිරියත හා උපකරණ ශේෂයන් CIGAS පද්ධතියට ඇතුළත් කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දී ඇති අතර මුදල් ශේෂය සටහන් කිරීම සිදු කළ යුතු බව පිළිගනිමි. |
| (ආ) | චක්‍රලේඛයේ 7(**iv**) ඡේදය ප්‍රකාරව මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දේපල, පිරියත හා උපකරණවල වටිනාකමට සමාන වටිනාකමක් ශුද්ධ වත්කම් / ප්‍රාග්ධනය යටතේ සංචිත වටිනාකමක් ලෙස දැක්විය යුතු වේ. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ 2018 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ දේපල, පිරියත හා උපකරණවල වටිනාකම ලෙස රු.254,645,748 ක් දක්වා තිබුණත්, දේපල, පිරියත රු.97,261,955 ක් අඩුවෙන් රු.157,383,793 ක් ලෙස දක්වා තිබුණි. | | |

| | | |
|---|---|---|
| (ඇ) භාණ්ඩාගාර අවසන් ගිණුම් ප්‍රකාශය අනුව 2018 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාරය වෙත නොපිය වූ අග්‍රිම ශේෂය රු.25,620,116 ක් වී තිබුණි. එය ජංගම වගකීම් යටතේ සටහන් කර තිබුණත්, එම නොපිය වූ මුදල් ශේෂය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ මුදල් හා මුදල්වලට සමාන දෑ ලෙස දක්වා නොතිබුණි. | | |
| (ආ) රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 7(v) ඡේදය ප්‍රකාරව අමාත්‍යාංශයේ ශුද්ධ වත්කම් දැක්විය යුතුව තිබුණේ අත්තිකාරම් ගිණුම් ශේෂයෙන් තැන්පත් ගිණුම් ශේෂය අඩු කළ පසු රු.10,046,566 ක් ලෙස වුවත්, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ එය රු.71,641,837 ක් වැඩියෙන් රු.81,688,403 ක් ලෙස දක්වා තිබුණි. | | |

**1.6.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දැක්විය යුතු රු.2,977,593 ක අත්තිකාරම් ලැබීම්, මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ ජනිත වූ මුදල් ප්‍රවාහයේ දක්වා තිබුණි. | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වීම. | අදහස් දක්වා නැත. |
| (ආ) මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කළ මුදල් ප්‍රවාහයේ රු.1,563,842 ක තැන්පත් ගෙවීම් ඇතුළත් කර නොතිබුණි. | | |
| (ඇ) ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයේ අත්තිකාරම් ලැබීම් හා ගෙවීම් ඇතුළත් කර නොතිබුණි. | | |

(ඇ) 2018 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගිණුමේ ශේෂය රු. 25,620,116 ක් වී තිබුණත්, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුදල් ශේෂය ලෙස එය දක්වා නොතිබුණි.

**1.6.4 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) **ඇප ලේඛනය** | | |
| ඇප තැබිය යුතු නිලධාරින් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප ලේඛනයක් පවත්වා ගත යුතු වීම. | ඇප ලේඛනයක් පිළියෙල කිරීමට විෂය භාර නිලධාරින්ට උපදෙස් දී ඇත. |
| (ආ) **හානි පිළිබඳ ලේඛනය** | | |
| හානි පිළිබඳ ලේඛනය විධිමත්ව පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව පවත්වාගෙන යාමට අදාළ නිලධාරීන්ට උපදෙස් දී ඇත. |
| (ඇ) **වාහන ලොග් පොත** | | |
| අමාත්‍යාංශය විසින් වාහන ලොග් පොත් යාවත්කාලීන කර පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 1645(අ) ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | ධාවනය කරන දුර හා දැවෙන ඉන්ධන ප්‍රමාණය ලොග් පොතෙහි සටහන් කිරීමට උපදෙස් දී ඇත. |
| (ඈ) **නිවාඩු ලේඛනය** | | |
| නිවාඩු පිලිබඳ ලේඛනය විධිමත්ව පවත්වා නොතිබුණි. | ආයතන සංග්‍රහයේ XII පරිච්ඡේදයේ 1.7 වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | නිවාඩු ලේඛනය විධිමත්ව සකස් කිරීම සඳහා උපදෙස් ලබා දී ඇත. |
| (ඉ) **විගණන විමසුම් ලේඛනය** | | |
| විගණන විමසුම් ලේඛනයක් පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 452(1) ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | පවත්වාගෙන යැමට අවශ්‍ය උපදෙස් ලබා දී ඇත. |

(ඊ) **බඩු ලේඛන පොත**

| | | |
|---|---|---|
| බඩු ලේඛන පොත පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 454(1) ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | පවත්වාගෙන යෑමට අවශ්‍ය උපදෙස් ලබා දී ඇත. |

## 1.6.5 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | අමාත්‍යාංශය අදාළ ආයතන සියල්ල සමඟ වරින් වර ප්‍රගති සමාලෝචන රැස්වීම්ද අමාත්‍යාංශයේ මාණ්ඩලික නිලධාරීන් සමඟ රැස්වීම්ද පවත්වන අතර ඉදිරියේදී එම රැස්වීම්වල සාකච්ඡා සටහන් විගණකාධිපති වෙත එවීමට කටයුතු කරනු ඇත. |
| (ආ) | විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත්, වාර්තාවේ 3.9 ඡේදය ප්‍රකාරව විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | විගණන විමසුම් සඳහා නියමිත කාල පරාසය තුළ පිළිතුරු සැපයීමට ඉදිරියේදී කටයුතු කරනු ඇත. |

## 1.6.6 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| විගණන නිරීක්ෂණය | | | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | | අනුකූල නොවීම | | |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | | |
| (i) | මුදල් රෙගුලාසි 103 (1)(ආ) | රජයේ දේපලකට යම් අලාභ හානියක් සිදු වූ විට ඒ පිළිබඳව පොලීසියට වාර්තා කළ යුතු වුවත්, 2018 වර්ෂයේදී සිදු වූ රිය අනතුරු 16 කින් 10 ක් පිළිබඳව පොලිසියට වාර්තා කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | ඉදිරියේ දී ඒ අනුව කටයුතු කිරීමට උපදෙස් දෙන ලදි. |
| (ii) | මුදල් රෙගුලාසි 104(3) | හානි පිළිබඳ පරිපූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරීමට දින හතකට වැඩි කාලයක් ගත වේ යැයි අපේක්ෂා කරන්නේ නම්, ප්‍රාරම්භක වාර්තාව පිළියෙල කළ යුතුව තිබුණි. ඇතැම් රිය අනතුරු පිළිබඳ ප්‍රාරම්භක වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට මාස 04 කටත් වැඩි කාලයක් ගත වී තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | ඇතැම් කරුණු නිසා මේ වන විට අතපසු වී තිබූ ප්‍රාරම්භක වාර්තා විගණකාධිපති වෙත යැවීමට කටයුතු කර ඇත. |
| (iii) | මුදල් රෙගුලාසි 104(4) | අනතුර පිළිබඳ පරීක්ෂණයෙන් පසු අලාභය සිදු වූ දිනයේ සිට තුන් මසක් ඇතුළත දී පූර්ණ වාර්තාව විගණකාධිපතිට ඉදිරිපත් කළ යුතු වුවත්, 2018 වර්ෂයේදී සිදු වූ රිය | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | වහාම අවසන් වාර්තා විගණකාධිපති වෙත එවීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| | අනතුරු 16 කින් 15 ක් පිළිබඳ පූර්ණ වාර්තා අනතුර සිදු වී මාස 03 ක් ඉක්මවා තිබුණ ද, 2018 දෙසැම්බර් 31 දින වන විටත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | | |
| **(ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** ------------------ | | | |
| 2002 පෙබරවාරි 25 දිනැති අංක 01/2002 දරන චක්‍රලේඛ ලිපිය | රජයේ වාහනවල ආයතනයේ නම වාහනයේ පින්තාරු කළ යුතු වුවත්, අමාත්‍යාංශය විසින් භාවිතා කරනු ලබන වාහන 33 අතරින් වාහන 10 ක අමාත්‍යාංශයේ නම වාහනයේ පින්තාරු කර නොතිබුණි. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | වාහනවල නම යෙදීමට පියවර ගැනීමට නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. |
| **(ඇ) රාජ්‍ය මුදල් චක්‍රලේඛ** ------------------- | | | |
| 2015 ජුලි 14 දිනැති අංක 03/2015 දරන චක්‍රලේඛය | අවස්ථා 17 කදී එකතුව රු.148,000 ක් වටිනා තත්කාර්ය අතුරු අග්‍රිම මාණ්ඩලික නොවන නිලධාරීන් වෙත නිකුත් කර තිබුණි. | රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | ඉදිරියේ දී ඒ අනුව කටයුතු කිරීමට උපදෙස් දෙන ලදි. |

**1.6.7 අවිධිමත් ගනුදෙනු**

--------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| (අ) ඛනිජතෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලයේ නිලධාරින්ට වැටුප් හා වේතන ගෙවීම සම්බන්ධයෙන් 2007 අප්‍රේල් 05 දිනැති අංක 33 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 5.4 ඡේදය ප්‍රකාරව ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩලය වෙත ඉතිරි කරගත් වෙද්‍ය නිවාඩු මත දීමනාව ගෙවීමට | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවීම | විශේෂ ව්‍යාපෘතියක් සේ සලකා වේතන ගෙවීම සඳහා අනුමත කරන ලද චක්‍රලේඛ අංක MSD 33 ප්‍රකාරව මෙම ගෙවීම උචිත නොවන බව ඔබ විසින් පෙන්වා දෙන ලද කරුණ සැලකිල්ලට ගෙන, මෙම ගෙවීම ද වේතන හා සම්බන්ධ ගෙවීමක් බැවින් |

| | | | |
|---|---|---|---|
| | නොහැකි වුවද, 2016 හා 2017 වර්ෂයන් සඳහා පිළිවෙලින් රු.701,450.34ක් හා රු.575,821.67 ක් ගෙවා තිබූ අතර ඉකුත් වර්ෂවල ද මෙම දීමනාව ගෙවා තිබුණි. | | 2018 වර්ෂයේ සිට අත්හිටුවීමට කටයුතු කරන ලදී. |
| (ආ) | 2007 අප්‍රේල් 05 දිනැති අංක 33 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 5.2 ඡේදය ප්‍රකාරව හිමිකම් නොලබන නිලධාරින් සඳහා ප්‍රවාහන දීමනා ලබා දීම වෙනුවෙන් 2017 ජනවාරි මාසයේ සිට 2018 ඔක්තෝබර් මාසය අවසානය දක්වා රු.3,419,246.24 ක් වියදම් කර තිබුණි. | - ඉහත පරිදි - | පසුගිය වසර 7 කට පමණ ආසන්න කාලයක සිට ඛනිජතෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලයේ සේවකයන් හට කිසිදු වැටුප් වැඩිවීමක් සිදු නොවූ බැවින් සේවක වැටුප සම්බන්ධයෙන් විධිමත් තීන්දුවක් ලද වහාම මෙය නිවැරදි කිරීම සිදු කිරීමට බලාපොරොත්තු වෙමි. |
| (ඇ) | සේවා ගිවිසුමට අනුව 2018 මාර්තු 15 දින සේවය අවසන් කළ යුතු ලේකම් කාර්යාලයේ හිටපු අධ්‍යක්ෂ (පරිපාලන හා මුදල් ) 2018 මාර්තු 24 දින විශ්‍රාම යැමට නියමිතව තිබුණි. මෙම නිලධාරියාගේ සේවා කාලය දීර්ඝ කර ගැනීම සඳහා 2018 පෙබරවාරි 08 දින හා 2018 මැයි 18 දින අමාත්‍ය මණ්ඩල සංදේශ ඉදිරිපත් කර තිබුණි. එහෙත් සේවා කාලය දීර්ඝ කිරීම අනුමත කර නොතිබූ අතර එම අමාත්‍ය මණ්ඩල තීරණයේ අමාත්‍යාංශයේ සේවයේ නියුතු ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරියෙකු වැඩ බැලීමේ පදනමින් පත් කරන ලෙස දක්වා තිබුණි. නමුත් එම තීරණය ක්‍රියාත්මක නොකර මෙම නිලධාරියාව 2018 ජුලි 31 දින වන තෙක් සේවයේ යොදවා ඒ වෙනුවෙන් වැටුප් හා දීමනා වශයෙන් රු.616,200 ක් ද, රාජකාරියට යාම හා ඒම සඳහා ප්‍රවාහන පහසුකම් ද ලබා දී තිබුණි.<br><br>උක්ත තත්ත්වය යටතේ 2018 මාර්තු 15 දින සිට 2018 ජුලි 31 දින දක්වා සේවයේ යොදවා සිටි හිටපු අධ්‍යක්ෂ (පරිපාලන හා මුදල්) විසින් එම | නිලධාරීන් සේවයේ යෙදවීම විධිමත් පරිදි සිදු කළ යුතුවීම.. | කැබිනට් තීරණය අමාත්‍යාංශය විසින් ඛනිජතෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලය වෙත 2018 ජුලි මස දැනුම් දුන් අතර වහාම ක්‍රියාත්මක වන පරිදි 2018 ජුලි 31 දින ඔහුගේ සේවය අත්හිටු වීමට අප විසින් කටයුතු කරන ලදී. ඔහුගේ සේවා දිගුව අපේක්ෂාවෙන් පසු වූ කාලපරිච්ඡේදය උදෙසා ගෙවන ලද වැටුප් හා දීමනා රු.790,624/94 (සේ. අ. අ. හා භා. අ. සමඟ ) ප්‍රතිපූරණය කරගැනීමට PRDS කළමනාකරණය විසින් අවශ්‍ය පියවර මේ වනවිටත් ගෙන ඇති අතර, ඒ සඳහා ඔහුගේ ප්‍රතිචාරය අපේක්ෂාවෙන් පසු වේ. 2018 ජුලි 31 දින වන තුරුත් ඔහුගේ සාමාන්‍ය රාජකාරි කටයුතුවල නියැලුණු අතර ඔහුගේ රාජකාරි සීමාව තුළ පිහිටමින් වවුචර් ගෙවීම හා අනුමත කිරීම සිදුකර තිබුණි. |

| | | | |
|---|---|---|---|
| | කාලපරිච්ඡේදය තුළ විධිමත් පත්වීමක් නොමැතිව රු.34,362,989 ක ගෙවීම් වවුචර 164 ක් අනුමත කර තිබුණි. | | |
| (ඇ) | ඉහත සඳහන් නිලධාරියාගේ සේවය අවසන් කිරීමෙන් පසුව පුරප්පාඩු වූ අධ්‍යක්ෂ ( පරිපාලන හා මුදල් ) තනතුරේ වැඩ බැලීම සඳහා අමාත්‍ය මණ්ඩල තීරණයන්ට අනුගත නොවී 2018 සැප්තැම්බර් 20 දින සිට ක්‍රියාත්මක වන පරිදි එම කාර්යාලයේ ගණකාධිකාරීවරිය පත් කර තිබුණි. | නිලධාරීන් සේවයේ යෙදවීම සඳහා විධිමත් අධිකාරී බලය සහිතව සිදු කළ යුතු වීම. | ඛනිජතෙල් අමාත්‍යාංශයේ පැවති අධික රාජකාරි බහුල තත්ත්වයන් මත මෙම තනතුරේ වැඩ බැලීම සඳහා නිලධාරියෙකු ලිහිල් කිරීම අපහසු වූ බැවින් එවකට එම තනතුරේ වැඩ ආවරණය කරමින් සිටි ඛනිජතෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලයේ ගණකාධිකාරිවරිය පුරප්පාඩු වූ තනතුරේ වැඩබැලීම සඳහා 2018/09/20 දින සිට පත් කරන ලදී. |
| (ඉ) | ලේකම් කාර්යාලයේ 2018 වර්ෂය සඳහා මුදල් රෙගුලාසි 135 යටතේ බලතල පැවරීම අනුව විදේශීය ගමන් වියදම් අනුමත කිරීමේ බලය අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත පමණක් පැවතිණි. එසේ වුවද නියැදි විගණන පරීක්ෂාවට අනුව රු.423,592 ක වටිනාකමින් යුත් විදේශ ගමන් වියදමක් ගණකාධිකාරී විසින් අනුමත කර තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | ඉදිරියේ දී බලතල පැවරීම අනුවම කටයුතු කිරීමට උපදෙස් ලබා දුනිමි. |
| (ඊ) | ඛනිජතෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලයේ 2018 අගෝස්තු 01 දින සිට ඔක්තෝබර් 31 දින දක්වා සිදුකළ එකතුව රු.44,529,662 ක් වූ ගෙවීම් 89 ක් සම්බන්ධයෙන් වියදම් සහතික කිරීම හා ගෙවීම යන කාර්යයන් දෙකම ගණකාධිකාරී විසින් ඉටු කර තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | 2018 අගෝස්තු 01 දින සිට ඔක්තෝබර් 31 දක්වා කාල පරාසය තුළ ගණකාධිකාරිවරිය විසින් අධ්‍යක්ෂ - පරිපාලන හා මුදල් තනතුරෙහි වැඩ ආවරණය හා වැඩ බැලීම යන කටයුතුවල නියැලුනු අතර, ඒමත පිහිටමින් වවුචර් පත් සහතික කිරීම හා ගෙවීම යන කාර්යයන් ඉටු කර ඇත. |

| | | |
|---|---|---|
| | | මීට අමතරව මෙම කාර්යයන් බෙදීමේ ක්‍රියාවලියේ දී ගිණුම් අංශය වෙත ඇති සීමිත සම්පත් යන කාරණය ද බලපා ඇති බව දැන්වීමට කැමැත්තෙමි. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

**2.1** **ආදායම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2015 ජුලි 20 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාරව නිවැරදිව ආදායම් පුරෝකථනය නොකිරීම නිසා අමාත්‍යාංශයේ 20.03.02.21 දරන ආදායම් සංකේතය යටතේ 2018 වර්ෂයේ සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව සියයට 23 කින් ඉක්මවා රු.30,300,068 ක ආදායම් රැස් කර තිබුණි.. | අදාළ චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | තාර වෙළඳාමෙහි යෙදෙන්නන් ආනයනය කරනු ලබන තාර මෙට්‍රික් ටොන් ප්‍රමාණය අනුව විචල්‍ය ගාස්තු ( Variable fee) අය කරනු ලබයි . ඒ අනුව විචල්‍ය ගාස්තු නිශ්චිතව ගණනය කළ නොහැකි බැවින් තාත්වික ඇස්තමේන්තු කළ නොහැකිවේ. |

**2.2** **වියදම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වැය විෂයයන් 18 ක් සඳහා රු.මිලියන 11.65 ක අධිප්‍රතිපාදන සළසා තිබීම නිසා එම වැය විෂයයන්වලින් උපයෝජනය කළ පසු ඉතිරිය, සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 25 ක සිට සියයට 100 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. | නිවැරදි වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතුය. | එකඟවෙමි. |

**2.3 තැන්පත් ශේෂයන්**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වර්ෂ 02 ක් ඉක්ම වූ රු. 233,391 ක තැන්පතුවක් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර රාජ්‍ය ආදායමට බැර කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | කමිටුවක් පත් කර එහි තීරණය පරිදි මෙම මුදල අදාළ පුද්ගලයා වෙත නිදහස් කිරීමට හෝ රජයේ ආදායමට බැර කිරීමට අවශ්‍ය පියවර ගනිමි. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 දැක්ම හා මෙහෙවර**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ඉන්ධන සැපයුමෙහි ගුණාත්මක තත්ත්වය හා විශ්වාසනීයත්වය දියුණු කිරීම ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය පිහිටුවීමේ එක් අරමුණක් වේ. මේ සඳහා අදාළ ප්‍රතිපත්ති වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය පසුවිපරම් කිරීම හා ඇගයීම අමාත්‍යාංශයේ එක් කාර්යයක් වේ. ඒ අනුව පාරිභෝගිකයන්ට ඉන්ධන අලෙවි කිරීම සඳහා 2018 දෙසැම්බර් 31 දින වන විට දිවයින පුරා ඉන්ධන පිරවුම්හල් 1461 ක් පැවති අතර ඉන් 1254 ක් ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවටත් ඉතිරි ඉන්ධන පිරවුම්හල් 207 ලංකා ඉන්දියානු තෙල් සමාගමටත් අයත් වේ. මේ සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය. | | |
| (අ) ලංකා ඉන්දියානු තෙල් සමාගමට අයත් ඉන්ධන පිරවුම්හල් 207 අතරින් ඉන්ධන පිරවුම්හල් 03 ක් පමණක් 2018 වර්ෂය තුළ අධීක්ෂණය කර තිබූ අතර එය සමාගමට අයත් පිරවුම්හල් සංඛ්‍යාවෙන් සියයට 1.4 ක් | අමාත්‍යාංශයේ අරමුණු කරා ළඟා වන පරිදි ප්‍රමාණාත්මක අධීක්ෂණයක් සිදු කළ යුතු වීම. | ප්‍රාදේශීය අධීක්ෂකවරුන්ගේ අධීක්ෂණ කටයුතු පිළිබඳව සොයා බැලීම සඳහා පත්කරන ලද අමාත්‍යාංශයේ විශේෂ අධීක්ෂණ කමිටුව විසින් ආරම්භක පියවරක් ලෙස දිවයිනේ ඉන්ධන පිරවුම්හල් |

| | | | |
|---|---|---|---|
| | පමණක් වී තිබුණි. ඒ අනුව ඉන්ධන පිරවුම්හල්වලින් ප්‍රමාණාත්මක නියැදියක් අධීක්ෂණය කර නොතිබුණි. | | වැඩි ප්‍රමාණයක් (85%) ඇති ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව සතු පිරවුම්හල් අධීක්ෂණය කරනු ලබන අතර ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ සහයෝගය ද ලබා ගනිමින් 2018.08.31 දින ලංකා ඉන්දියානු තෙල් සමාගමේ ඉන්ධන පිරවුම්හල් ද අධීක්ෂණය ආරම්භ කරන ලදී. |
| (ආ) | ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවට අයත් ඉන්ධන පිරවුම්හල් 1254 අතරින් ඉන්ධන පිරවුම්හල් 73 ක් හෙවත් සියයට 5.8 ක් අමාත්‍යාංශය විසින් 2018 වර්ෂය තුළදී භෞතික පරීක්ෂාවට ලක් කර තිබුණි. එහෙත් එම ප්‍රමාණය ප්‍රමාණාත්මක නොවන බව ද, අමාත්‍යාංශයේ උක්ත අරමුණ ඉටු කර ගැනීමට බාධා වන ආකාරයේ අඩුපාඩු ඉන්ධන පිරවුම්හල්වල ප්‍රමාණාත්මකව පැවති බවද අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන වාර්තාවලින් පෙන්වා දී තිබුණි. | ඉන්ධන සැපයුමෙහි ගුණාත්මක තත්ත්වය හා විශ්වාසනීයත්වය දියුණු කිරීමට බාධාවන අඩුපාඩු වලක්වා ගැනීමට හැකි වන ආකාරයට අධීක්ෂණ කටයුතු පුළුල් කළ යුතු වීම. | නිරීක්ෂණ සමඟ එකඟ වෙමි. මෙම අඩුපාඩු නිවැරදි කිරීමට ප්‍රාදේශීය අධීක්ෂණ නිලධාරීන් හරහා කටයුතු සිදු කර ඇත. මීට අමතරව ඉන්ධන නිකුත් වන පොම්ප නිවැරදි කිරීමට, නීත්‍යානුකූලව පියවර ගැනීමට හා පොම්පවල මුද්‍රා තැබීම ප්‍රමාද වීම පිළිබඳව සොයා බලා කටයුතු කර දන්වන ලෙස අධ්‍යක්ෂ, මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව වෙත ලිඛිතව දන්වා ඇත. |

**3.2 සැලැසුම් කිරීම**

-----------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය විසින් 2018 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණ ද, එය 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව පිළියෙල කර නොතිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ ක්‍රියාකාරී සැලැස්ම තුළ පහත කරුණු අන්තර්ගත කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | නිරීක්ෂණ සමඟ එකඟ වෙමි. 2019 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීමේදී විගණන විමසුමේ සඳහන් කරුණු ඇතුළත් කිරීමට නිලධාරීන්ට උපදෙස් ලබා දුනිමි. |

(i) අදාළ වර්ෂයට යාවත්කාලීන කළ ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය සහ දැනට සේවයේ සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර

(ii) අයවැය ඇස්තමේන්තුවල සඳහන් එක් එක් ආදායම් ශීර්ෂයන් වෙනුවෙන් ආදායම් එකතු කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම

(iii) වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අක්මුදල් අවශ්‍යතා සැලැස්ම

(iv) සැලැසුම් කර ඇති ප්‍රධාන සංවර්ධන වැඩසටහන් (ආයතන මෙහෙයුම් කටයුතු, ගොඩනැගිලි හා වාහන නඩත්තු සහ පුනරුත්ථාපන කටයුතු හැර) වෙනුවෙන් වන වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

**3.3 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්**

**-------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) **2002 අංක 33 දරන ඛනිජතෙල් නිෂ්පාදන (විශේෂ විධිවිධාන) පනත සහ 1961 අංක 28 දරන ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථා පනත සංශෝධනය කිරීම** | | |
| 2004 වර්ෂයේ සිට ඛනිජතෙල් කර්මාන්තය සම්බන්ධයෙන් නියාමන අධිකාරියක් නොමැති වීම නිසා ඛනිජතෙල් කර්මාන්තයද, 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් | අමාත්‍යාංශයේ අරමුණු ඉටු කර ගැනීම සඳහා වන ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ප්‍රමාදයකින් | වර්තමාන විෂයභාර අමාත්‍යවරයාගෙන් මෙම පනත් කෙටුම්පත් සංශෝධනයේ ඉදිරි කටයුතු කරගෙනයාම සම්බන්ධයෙන් උපදෙස් හා |

| | | | |
|---|---|---|---|
| | සහා පනත යටතේ නියාමනයට ලක් කෙරෙන කර්මාන්ත අතරට ඇතුළත් කිරීම සඳහා 2006 වර්ෂයේ දී පාර්ලිමේන්තුවේ යෝජනාවක් සම්මත කර ගෙන තිබුණි. ඒ අනුව කර්මාන්තය නියාමනයට අවශ්‍ය මෙවලම් මහජන උපයෝගිතා කොමිෂන් සභාවට සපයා දීම සඳහා 2002 අංක 33 දරන ඛනිජතෙල් නිෂ්පාදන (විශේෂ විධිවිධාන) පනත සහ 1961 අංක 28 දරන ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථා පනත යන පනත් දෙක සංශෝධනය කිරීමට අදාළ මූලික කටයුතු 2006 වර්ෂයේදී ආරම්භ කර තිබුණ ද, 2018 දෙසැම්බර් 31 දින වන විටත් එය නිම කර නොතිබුණි. | තොරව ඉටු කළ යුතු වීම. | අනුමැතිය ලබා ගැනීම සඳහා 2019.03.22 දිනැතිව කරුණු වාර්තාකර ඇති අතර එම උපදෙස් ලද පසු ඉදිරි කටයුතු කිරීමට නියමිතය. |
| (ආ) | **ජාතික වායු ප්‍රතිපත්තිය සැකසීම**<br>---------------------------------- | | |
| | 2015 සැප්තැම්බර් 21 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පල කළ නිවේදනයක් මගින් ස්වාභාවික ගෑස් පිළිබඳව ජාතික ප්‍රතිපත්තියක් සැකසීම සඳහා ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය වෙත බලය ලබා දී තිබුණි. 2018 ජූනි මාසය වන විට සකස් කර අවසන් කිරීමට සැලැසුම් කර තිබුණු මෙම ජාතික වායු ප්‍රතිපත්තිය 2018 දෙසැම්බර් 31 දින වන විටත් අවසන් කර නොතිබුණි. | අමාත්‍යාංශයේ අරමුණු ඉටු කර ගැනීම සඳහා වන ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ප්‍රමාදයකින් තොරව ඉටු කළ යුතු වීම. | යාවත්කාලීන කරන ලද ප්‍රතිපත්ති කෙටුම්පත කඩිනමින් මෙම අමාත්‍යාංශය වෙතට ලබා දීමට නියමිතව ඇත. ඉන්පසුව එම ප්‍රතිපත්ති කෙටුම්පත අනුමැතිය සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට අපේක්ෂිතය. |
| (ඇ) | **ත්‍රිකුණාමලය තෙල් ටැංකි සංකීර්ණය සංවර්ධනය හා පුනරුත්ථාපනය**<br>------------------------------ | | |
| | භූගෝලීය පිහිටීම අනුව මුළු ලෝකයේම අවධානය යොමුවී ඇති ලෝකයේ දෙවන ගැඹුරුතම වරාය වන ත්‍රිකුණාමල වරාය තුළ 1930 වර්ෂයේ සිට ස්ථාපිත කර ඇති තෙල් ටැංකි පද්ධතිය ඝණ මීටර් 12,500 ක ධාරිතාවකින් යුත් ටැංකි 102 කින් හා අනෙකුත් | - ඉහත පරිදි - | මේ සඳහා සංස්ථාවට සහ ඉන්දියානු තෙල් සමාගමට කොටස් මිලදී ගැනීමට හැකිවන පරිදි උප සමාගමක් පිහිටුවීමට අවශ්‍ය කටයුතු කරන ලෙස මුදල් අමාත්‍යාංශය වෙත දන්වා තිබුණ ද සංස්ථාවේ පොදු |

| | | | |
|---|---|---|---|
| | ආශ්‍රිත පහසුකම් වලින් සමන්විත වේ. දැනට පවතින මුළු ටැංකි 99 කින් පහළ කොටසේ ටැංකි 14 ක් ලංකා ඉන්දියානු තෙල් සමාගම භාවිතා කරනු ලැබේ. අතහැර දමා තිබෙන ඉහළ කොටසේ ටැංකි 84 නවීකරණය සඳහා මූලික තීරණ ගැනීමේ කටයුතු 2015 අප්‍රේල් 29 දින ආරම්භ කර තිබුණ ද, ටැංකි සංකීර්ණයේ සංවර්ධනය හා පුනරුත්ථාපනය සඳහා අවශ්‍ය කටයුතු 2018 දෙසැම්බර් 31 දින වන විටත් ඉටු කර නොතිබුණි. | | සේවක සහ විධායක නිලධාරීන්ගේ වෘත්තීය සමිති මඟින් ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් පවරා ඇති බැවින් එම නඩු තීන්දුව ලැබුණු පසු මෙහි ඉදිරි කටයුතු සිදුකිරීමට නියමිතය. |
| (ඇ) | **තෙල් පිරිපහදුව නවීකරණය හා පුළුල් කිරීම**<br>-------------------------------------<br>1969 වර්ෂයේ දී ස්ථාපිත කරන ලද වර්තමාන තෙල් පිරිපහදුව නවීකරණය හා පුළුල් කිරීම සම්බන්ධව ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක කමිටු රැස්වීම් කිහිපයකදී 2015 මාර්තු 15 දින සිට විස්තරාත්මකව සාකච්ඡා කර තිබුණි. යෝජිත ව්‍යාපෘතියේ මූල්‍ය ශක්‍යතාවය අධ්‍යයනය කිරීම සඳහා විද්වත් කමිටුවක් පත් කර තිබුණ ද 2018 දෙසැම්බර් 31 දින වන විටත් ඒ සම්බන්ධව ප්‍රගතියක් අත්කර ගෙන නොතිබුණි. | අමාත්‍යාංශයේ අරමුණු ඉටු කර ගැනීම සඳහා වන ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ප්‍රමාදයකින් තොරව ඉටු කළ යුතු වීම. | නවීකරණ කටයුතු සඳහා වන පිරිවැය ඇස්තමේන්තුව සැකසීම සහ ශක්‍යතා අධ්‍යයනය සිදු කිරීම සඳහා ලංසු කැඳවන ලද අතර මේ වන විට ලංසු ඇගයීම සිදු කරමින් පවතී. |
| (ඉ) | **නව ඉන්ධන තොග ගබඩාවක් උතුරු පළාතේ ස්ථාපනය කිරීම**<br>------------------------------------<br>කන්කසන්තුරේ සිමෙන්ති සංස්ථාව සතු භූමියේ පිහිටුවා ඇති තෙල් තොග ගබඩාව, එම ස්ථානයෙන් ඉවත්කර ගන්නා ලෙසට 2011 වර්ෂයේදී සිමෙන්ති සංස්ථාව විසින් ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම වෙත දන්වා තිබුණි. නව තොග ගබඩාවක් ස්ථාපනය කිරීම සඳහා සුදුසු ඉඩමක් ලබාගැනීමට නොහැකි වීම නිසා පවතින තෙල් තොග ගබඩාවම නවීකරණය හා | - ඉහත පරිදි - | ගබඩාව පිහිටා ඇති භූමිය සංස්ථාව වෙත බදු දීමට යෝජනා කරමින් ඉඩම් අමාත්‍යාංශය විසින් 2019.02.08 දිනැති ගැසට් නිවේදනය පලකර ඇත. ඒ අනුව ඉදිරි කටයුතු සිදුකිරීම සඳහා ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව විසින් පියවර ගත යුතුය. |

පුළුල් කිරීම සිදු කර පවත්වාගෙන යාම සඳහා 2016 ඔක්තෝබර් 19 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අනුමැතිය ලැබී තිබුණි. නමුත් ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම විසින් සිමෙන්ති සංස්ථාවට ගෙවිය යුතු රු.මිලියන 126.3 ක හිඟ කුලී මුදල ගෙවා නොමැති බැවින් මෙම ව්‍යාපෘතිය 2018 දෙසැම්බර් 31 දින වන විටත් ඉටු කිරීමට නොහැකි වී තිබුණි.

## 3.4 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ) ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය** | | |
| රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 මාර්ගෝපදේශය ප්‍රකාරව පිළියෙල කළ යුතු වර්ෂ 03 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ඇතුළත් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ සඳහන් විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුවීම. | ඉදිරියේදී ප්‍රසම්පාදන සැලැස්ම වසර 3 කට අදාළව පිළියෙල කිරීමට උපදෙස් දී ඇත. |
| **(ආ) ඛනිජතෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලය** | | |
| (i) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 මාර්ගෝපදේශයට අනුව ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් ප්‍රසම්පාදන සැලැස්ම හා එළැඹෙන වර්ෂය සඳහා වූ ප්‍රසම්පාදන කටයුතු විස්තරාත්මකව පිළියෙල කළ යුතු වුවත්, ලේකම් කාර්යාලය විසින් 2018 වර්ෂයේ දී ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි. | - ඉහත පරිදි - | 2019 වර්ෂය සඳහා වූ ප්‍රසම්පාදන සැලැස්ම ඛනිජතෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලය විසින් පිළියෙල කර ඇත. |

| | | |
|---|---|---|
| (ii) පිරිසිදු කිරීමේ සේවාව ලබා ගැනීම සඳහා 2013 වර්ෂයේ දී පිරිසිදු කිරීමේ ආයතනයක් තෝරා ගෙන තිබුණු අතර 2018 වර්ෂය දක්වාම පැරණි සේවා ගිවිසුම මතම එම ආයතනය මඟින් සේවාව ලබා ගෙන තිබුණි. ඒ අනුව 2018 වර්ෂය වෙනුවෙන් පිරිසිදු කිරීමේ සේවාව සඳහා මෙම ආයතනය තෝරා ගැනීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | - ඉහත පරිදි - | 2013 වර්ෂයේ දී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ විධිවිධාන අනුව පිරිසිදු කිරීමේ සේවාව සඳහා මසකට රු.36,500 ක් ගෙවීමේ පදනම මත සැපයුම්කරුවෙකු තෝරා ගන්නා ලදි. කෙසේ නමුත් 2013 වර්ෂයේ සිට 2018 වර්ෂය යන කාල පරාසය තුළ ඇති උද්ධමනයද සැලකිල්ලට ගෙන, තව ද ඔවුන්ගේ සේවාවේ ගුණාත්මභාවය පිළිබඳව සෑහීමකට පත් වීමට හැකි වූ බැවින් හිටපු අධ්‍යක්ෂ පාලන හා මුදල්ගේ නිර්දේශ මත ඔවුන්ගේ සේවාව මසකට රු. 50,000 ක් ගෙවීමේ පදනම මත ලබා ගන්නා ලදි. |

**3.5 වත්කම් කළමනාකරණය**

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) **වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම** | | |
| අමාත්‍යාංශය විසින් 2015 හා 2017 වර්ෂවල සිට බාහිර පාර්ශවයන් සතු වාහන 02 ක් විධිමත්ව පවරා ගැනීමකින් තොරව භාවිතා කර තිබුණි. | බාහිර පාර්ශවයන් සතු වත්කම් විධිමත්ව පවරා ගැනීමට කටයුතු කළ යුතු වීම | මෙම මෝටර් රථ විධිමත් පරිදි එම වාහන සතු ආයතනය වෙත භාර දීම සඳහා වාචිකව දන්වා ඇත. |
| (ආ) **බාහිර පාර්ශ්වයන් වෙත ලබා දී ඇති වත්කම්** | | |
| අමාත්‍යාංශය විසින් 2016 සහ 2017 යන වර්ෂවලදී වාහන 03 ක් විධිමත් පවරා දීමකින් තොරව බාහිර පාර්ශවයන් වෙත මුදා හැර | වත්කම් විධිමත්ව බාහිර පාර්ශවයන් වෙත පැවරීම සිදු කළ යුතු වීම. | වාහන පවරා දීමේදී හා නැවත භාර ගැනීමේදී විධිමත් ක්‍රමවේදයන්ට අනුව සිදු කිරීමට අදාළ |

| | | |
|---|---|---|
| තිබුණි. | | නිලධාරීන්ට උපදෙස් දුනිමි. |

(ඇ) **වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

| | | |
|---|---|---|
| 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙහි 3.1.6 ඡේදය ප්‍රකාරව 2018 වර්ෂය සඳහා වූ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාව 2019 මාර්තු 17 දිනට පෙර විගණකාධිපති වෙත යොමු කළ යුතු වුවත්, අමාත්‍යාංශයේ සහ ලේකම් කාර්යාලයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා එපරිදි විගණනයට ඉදිරිපත් කර න නොතිබුණි. | අදාළ චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | පිළිගනිමි. ඉදිරියේදී නියමිත කාල රාමුව තුල කටයුතු කිරීමට සටහන් කර ගතිමි. |

## 3.6 රජයේ නිලධාරීන් ඇප තැබීම

**පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මුදල් රෙගුලාසි 880(i) ප්‍රකාරව සහ ඇප ආඥා පනතට අනුව ඇප තැබිය යුතු ආමාත්‍යාංශයේ සහ ලේකම් කාර්යාලයේ නිලධාරීන් ඇප තැබීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | ඇප ආඥා පනතට අනුව ඇප තැබිය යුතු නිලධාරීන්ගෙන් ඇප ලබා ගැනීමට පියවර ගැනීම සඳහා අදාළ නිලධාරින්ට උපදෙස් ලබා දුනිමි. |

## 3.7 පාඩු හා හානි

**පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| විගණනයට ඉදිරිපත් කර තිබුණු මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දින වන විට කපා හැර නොතිබුණු පාඩු හා අත්හැරීම් | මුදල් රෙගුලාසි 104 හා 109 ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | එකඟ වෙමි. මේ පිළිබඳව විශේෂයෙන් සොයා බැලීමට සටහන් කර ගතිමි. |

| | | |
|---|---|---|
| ලෙස රිය අනතුරු 18 කට අදාළ රු.1,064,226 ක් දක්වා තිබුණි. එම අනතුරුවලින්, අනතුරු 16 කට අදාල රු.1,040,874 ක අලාභහානි සම්බන්ධ අනතුරු සිදු වූ දිනයන් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. එම අලාභහානි වර්ෂ 03 කට අධික කාලයක සිට පැවත එමින් තිබුණු පාඩු හා අත්හැරීම් වී තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර පොත්වලින් කපා හැරීම සිදු කර නොතිබුණි. | | |

## 3.8 අනාර්ථික ගනුදෙනු

---------------------

ඛනිජතෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ----------------------- | ------------ | ------------------------------- |
| (අ) ඛනිජතෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලය, කොළඹ 07 මල්වත්ත පාරේ පිහිටි පැරණි කාර්යාලයේ සිට නව කාර්යාලයට මාරු වීමේ දී එම පැරණි කාර්යාලයේ තිබූ පැරණි භාණ්ඩ ගබඩා කිරීම සඳහා නිවසක් කුලී පදනම මත ලබාගෙන තිබුණු අතර මෙම භාණ්ඩ 2013 අප්‍රේල් මාසයේ සිට නිෂ්කාර්යව පැවතුණි. රජයේ ආයතනවල අපහරණය කළ යුතු භාණ්ඩ සම්බන්ධයෙන් 2009 නොවැම්බර් 13 දිනැති අංක 438 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මගින් උපදෙස් ලබා දී තිබුණ ද, ලේකම් කාර්යාලය ඊට අනුගතව කටයුතු නොකර මෙම නිවස සඳහා කුලී ලෙස මාසිකව රු. 12,000 ක් බැගින් 2013 අප්‍රේල් මාසයේ සිට 2018 මැයි මාසය දක්වා වූ කාලපරිච්ඡේදය තුළ රු.744,000 ක අනාර්ථික වියදමක් කර තිබුණි. | අදාළ චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | රජයේ ආයතනවල අපහරණය කළ යුතු භාණ්ඩ හා වත්කම් නියමිත පරිදි අපහරණය කළ යුතු වූ බැවින්, අපහරණය කළ යුතු භාණ්ඩ හඳුනා ගෙන ඒවා නියමිත කාලවකවානුවල දී සිදුකර නොතිබීම අඩුපාඩුවක් වශයෙන් දකිනු ලබන අතර, ඉදිරියේ දී භාවිතයට අවශ්‍ය වන උපකරණ හා ද්‍රව්‍යයන් ද මෙම ගබඩාවේ ගබඩා කර ඇති බැවින් අපහරණය කළයුතු උපකරණ 2018 භාණ්ඩ සමීක්ෂණයෙන් හඳුනාගෙන එය ඉතා කඩිනමින් සිදුකිරීමට උපදෙස් ලබා දී ඇත. |
| (ආ) ආයතන සංග්‍රහයේ XV වන පරිච්ඡේදයේ 11.1 වගන්තිය ප්‍රකාරව රජයේ නිලධාරීන් රාජකාරි සඳහා ගුවන් මගින් විදේශ ගත | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | පෙර පත් වී සිටි අධ්‍යක්ෂ ජනරාල්වරු දෙදෙනාම විදේශ ගතවීමේ දී ව්‍යාපාරික පන්තියේ |

| | | |
|---|---|---|
| වීමේදී පිරිමැසුම් පන්තියෙහි (Economy Class) ගමන් කළ යුතු වුවත්, ලේකම් කාර්යාලයේ නිලධාරින් විධිමත් අනුමැතියක් ලබා නොගෙන ව්‍යාපාරික පන්තිය (Business Class) භාවිතා කළ අවස්ථා 04 ක් අනාවරණය විය. මේ සඳහා ලේකම් කාර්යාලය විසින් රු. 755,556 ක අතිරේක වියදමක් සිදු කර තිබුණි. | | ගුවන් ටිකට් පත් භාවිතා කරන ලදී. මෙම පිළිවෙලම අනුගමනය කරමින් වත්මන් අධ්‍යක්ෂ ජනරාල්වරයා ද විදේශ ගතවීම්වලදී ව්‍යාපාරික පන්තියේ ගුවන් ටිකට් පත් භාවිතා කරන ලදී. ඉදිරියේ දී පිරිමැසුම් පන්තිය (Economy Class) යොදා ගැනීමට උපදෙස් දුනිමි. |

**3.9 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම**

---------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 වර්ෂය සඳහා අමාත්‍යාංශය වෙත යොමු කරන ලද විගණන විමසුම් 10 ක් සඳහා පිළිතුරු ලබා දීමේ දී 2019 මාර්තු 31 දිනට, නිශ්චිත කාලසීමාව ඉක්මවා දින 15 ත් දින 48 ත් අතර පරාසයක කාලයක් ප්‍රමාද කර පිළිතුරු සපයා තිබුණි. තවද, 2018 ජුලි 17 දින අමාත්‍යාංශය වෙත නිකුත් කරන ලද 2017 වර්ෂයේ කළමනාකරණ විගණන වාර්තාව සඳහා මාස 08 ක කාලයක් ගත වී තිබුණ ද අමාත්‍යාංශය විසින් 2019 මාර්තු 31 දින වන විටත් පිළිතුරු සපයා නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(1)(ඉ) උපවගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | අමාත්‍යාංශය වෙත නිකුත්වන විගණන විමසුම් සඳහා එක් එක් අංශ වලින් පිළිතුරු ලබා ගනිමින් ඒකාබද්ධ පිළිතුරක් සකස්කර විගණකාධිපති වෙත ඉදිරිපත් කරයි. මෙම ඒකාබද්ධ පිළිතුරු සකස් කිරීමේ කුමන හෝ එක අංශයක ප්‍රමාදයක් සමස්ත පිළිතුරු ප්‍රමාද වීම සඳහා බලපෑම් සිදුවන බැවින් මෙවැනි අවස්ථාවන් වලදී අතුරු පිළිතුරක් හෝ ඉදිරිපත් කිරීමට ඉදිරියේ දි කටයුතු කරමි. |

**3.10 මත භේදයට තුඩුදෙන ගනුදෙනු**

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ගරු විෂයභාර අමාත්‍යවරයාට 2018 ඔක්තෝබර් 18 දින සිට 20 දින | 2015 මැයි 15 දිනැති අංක 01/2015/01 | මෙම මුදල අය කර ගැනීමට ඉදිරියේ දී කටයුතු කරනු |

| | | | |
|---|---|---|---|
| | දක්වා ඉන්දීය සංචාරයකට සහභාගී වීම වෙනුවෙන් රු.76,209 ක් (ඇමරිකානු ඩොලර් 440 ක්) ක දීමනා වැඩිපුර ගෙවා තිබුණි. | දරන මුදල් අමාත්‍යාංශයේ චක්‍රලේඛයේ 04(ඇ) ඡේදය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | ඇත. |
| (ආ) | 2018 ජුනි 26 දිනැති අංක 13/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 03 ඡේදයට පටහැනිව 2018 වර්ෂයේදී ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ නිල වාහන හිමිකම් ඇති නිලධාරින් තිදෙනෙකුගේ පුද්ගලික ගමන් වෙනුවෙන් රියදුරන්ට අතිකාල දීමනා හා සංයුක්ත දීමනා වශයෙන් රු.250,724 ක් අමාත්‍යාංශය විසින් ගෙවා තිබුණි. | 2018 ජුනි 26 දිනැති අංක 13/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. | නිලධාරීන්ගේ පුද්ගලික ගමන් සඳහා රියදුරන් යොදවා ගන්නා විට ඒ සඳහා දරන වියදම රජයට වැය බරක් නොවිය යුතු වුවත්, රු. 250,724 ක මුදලක් රියදුරන්ට අතිකාල හා සංයුක්ත දීමනා වශයෙන් ගෙවීම පුද්ගලික ගමන් සඳහා ගෙවා ඇති බව සනාථ කර ගැනීමට හැකියාවක් නොමැති බව සඳහන් කරමි. |
| (ඇ) | 2018 අගෝස්තු 29, 30 හා 31 යන තෙදින පැවති එන්ටර්ප්‍රයිසස් ශ්‍රී ලංකා ප්‍රදර්ශනය සඳහා ලේකම් කාර්යාලයේ නිලධාරින් සිව් දෙනෙකු සහභාගි වීම වෙනුවෙන් එක් නිලධාරියෙකු දිනකට රු.1,500 බැගින් දින 03 ක් සඳහා නිලධාරින් සිව් දෙනාට රු. 18,000 ක උපරිම සංයුක්ත දීමනාවක් පමණක් ප්‍රතිපූර්ණය කළ හැකි නමුත් ලේකම් කාර්යාලය විසින් මෙම නිලධාරින්ගේ නවාතැන් හා ආහාර ඇතුළු අනෙකුත් වියදම් සඳහා රු.96,104 ක් වැය කර තිබුණි. | අදාළ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ හා ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | මෙවැනි අවස්ථාවන්හි දී ඔවුන්ට දෙනු ලබන සංයුක්ත දීමනාවෙන් ඉඳුම් හිටුම්, ආහාරපාන සියල්ල සලසා ගත නොහැකි අතර සියලු රාජ්‍ය ආයතන අනුගමනය කරනු ලබන පරිදි ආයතනය විසින් නවාතැන් පහසුකම් හා ආහාරපාන සලසනු ලැබේ. රජයේ ආයතනයක් නියෝජනය කරමින් ඔවුන් කරනු ලබන සේවාව වෙනුවෙන් පූර්ණ ආක්ෂාව සපයා දීම ආයතනයේ වගකීම වන බැවින්, ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලය විසින් අනුමත නිකේතනයක ඔවුන්ට නවාතැන් පහසුකම් සැලසීමට කටයුතු යොදන ලදී. |
| (ඈ) | ඛනිජතෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලය විසින් එහි සේවයේ නියුතු නිලධාරින් 24 දෙනෙකු ආවරණය වන පරිදි පෞද්ගලික රක්ෂණ සමාගමක් වෙතින් සෞඛ්‍ය රක්ෂණාවරණයක් ලබාගෙන තිබුණි. එම රක්ෂණාවරණයට අදාළව 2018 | රජයේ වියදම අවම වන හා සාධාරණ ප්‍රතිලාභ හිමි වන ආකාරයේ සෞඛ්‍ය රක්ෂණාවරණයක් විධිමත් අනුමැතියක් ඇතිව නිලධාරීන් වෙත ලබා දීමට | ඔබ විසින් පෙන්වා දෙන ලද පරිදි පිරිවැය අවම කිරීමේ අභිලාෂයෙන් රක්ෂණාවරණයට අදාළ ප්‍රතිලාභ අඩුකර අඩු පිරිවැයක් යටතේ මෙම ආවරණය ලබා ගැනීමට කටයුතු කිරීමට අවශ්‍ය |

| | | |
|---|---|---|
| වර්ෂය සඳහා ලේකම් කාර්යාලය විසින් එක් නිලධාරියෙකු වෙනුවෙන් රු.89,300 ක් වැය කර තිබුණි. | පියවර ගැනීම. | උපදෙස් ලබා දී තිබේ. |

**4. තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 ‘‘න්‍යාය පත්‍රය’’ ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව අමාත්‍යාංශය විසින් තම විෂයපථය යටතට ගැනෙන කාර්යයන්ට සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා විය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ළගාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා විය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ළගාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනා ගැනීමට කටයුතු කළ යුතු වීම. | අරමුණු ඉටුකර ගැනීමේ එක් දර්ශකයක් වශයෙන් අමාත්‍යාංශය විසින් කෙටුම්පත් කරනු ලබන ජාතික වායු ප්‍රතිපත්තිය හඳුනාගෙන ඇති බව සඳහන් කරමි. |
| (ආ) | අමාත්‍යාංශය විසින් තිරසර සංවර්ධන අරමුණු ඉටුකර ගැනීම සඳහා අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය මෙහෙයවීම සම්බන්ධයෙන් 2018 දෙසැම්බර් 31 දින වන විටත් කිසිදු අභ්‍යන්තර චක්‍රලේඛයක් හෝ මඟපෙන්වීමක් නිකුත් කර නොතිබුණු අතර ඒ පිළිබඳව උනන්දුවක් දක්වන පාර්ශව වෙත දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහනක් හෝ ක්‍රියාත්මක කර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධයෙන් අභ්‍යන්තර චක්‍රලේඛ / මඟපෙන්වීම් නිකුත් කිරීම උනන්දුවක් දක්වන පාර්ශව වෙත දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතු වීම. | මෙම අමාත්‍යාංශයට අදාළ වැඩසටහන් පිළිබඳව ලිඛිතව දැනුවත් කිරීමෙන් පසු අවශ්‍ය කටයුතු කිරීමට සටහන් කර ගන්නා ලදී. |
| (ඇ) | අමාත්‍යාංශය විසින් තිරසර සංවර්ධන ඉලක්ක කරා ළඟාවීමේදී ඒ පිළිබඳව දත්ත එක්රැස් කිරීමේ ක්‍රමවේදයක් ස්ථාපිත කර නොතිබුණු අතර ඒ සඳහා නිලධාරියෙකු යොදවා නොතිබුණි. | තිරසර සංවර්ධන ඉලක්ක පිළිබඳව දත්ත එක්රැස් කිරීමේ ක්‍රමවේදයක් ස්ථාපිත කර ඒ සඳහා නිලධාරියෙකු යෙදවිය යුතු වීම. | දත්ත එක් රැස් කිරීමේ ක්‍රමවේදයක් සම්බන්ධව මෙම අමාත්‍යාංශය ලිඛිතව දැනුවත් කිරීමෙන් පසු අවශ්‍ය කටයුතු කිරීමට සටහන් කර ගන්නා ලදී. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය විසින් තිරසර සංවර්ධන ඉලක්ක කරා ළඟාවීම සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන හඳුනාගෙන නොතිබුණු අතර අමාත්‍යාංශයේ දැනට පවතින භෞතික සම්පත් හා කාර්ය මණ්ඩලය ඒ සඳහා යොදවා ගැනීමේ ක්‍රමවේදයක් හා තිරසර සංවර්ධන ඉලක්ක ළඟාකර ගැනීමට අදාල කාර්යයන් නියාමනය සඳහා ක්‍රමවේදයක් හඳුනාගෙන නොතිබුණි. | තිරසර සංවර්ධන ඉලක්ක කරා ළඟාවීම සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන සහ මානව හා භෞතික සම්පත් හඳුනා ගත යුතු අතර එම සම්පත් යොදා ගැනීමේ ක්‍රමවේදයක් ස්ථාපිත කළ යුතු වීම. | අමාත්‍යාංශය විසින් තිරසර සංවර්ධන ඉලක්ක ලෙස හඳුනාගෙන ඇති ජාතික වායු ප්‍රතිපත්තිය සැකසීම හා EURO 4 ඉන්ධන හඳුන්වා දීමේ කටයුතු සඳහා රු.මිලියන 3 ක් 2019 වර්ෂයේ අයවැය ඇස්තමේන්තු සකස් කිරීමේදී මුදල් අමාත්‍යාංශය වෙතින් ඉල්ලුම් කරන ලදී. නමුත් ඒ සඳහා ප්‍රතිපාදන ලැබී නොමැත. |